## සුරක්ෂිතතා සහ සෞඛ්‍ය කමිටුවක් යනු..........

සුරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න සේවා ස්ථානයක් ඇතිකරලීම සඳහා සේව්‍ය සේවක දෙපාර්ශවයේ එකතුවකින් සැදි කමිටුවක් සුරක්ෂිතතා සහ සෞඛ්‍ය කමිටුවක් ලෙස හැඳින්විය හැකිය.

## සුරක්ෂිතතා සහ සෞඛ්‍ය කමිටු පිහිටුවීම මගින් ලැබෙන ප්‍රතිලාභ...

- සේවා ස්ථානයේ ඇති උපද්‍රවයන් හඳුනා ගැනීමට පහසු වීම.
- සේවා ස්ථානයේ අවදානම් අවම කරගැනීම සඳහා සේවක සේව්‍ය දෙපාර්ශවයේ එකමුතුවක් ඇතිවීම.
- සේවා ස්ථානයේ සුරක්ෂිතතා සංස්කෘතියක් ඇතිකර ගැනීමට උපකාරී වීම.
- සේවා ස්ථානයේ සුරක්ෂිතතා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරලීමට උපකාරී වීම.

## සුරක්ෂිතතා සහ සෞඛ්‍ය කමිටුවේ ව්‍යුහය සේවා යෝජකයාට අවශ්‍යය පරිදි තීරණය කල හැක

එසේ වුවත් සේවා ස්ථානයක ඉතා හොඳ භාවිතය පහත පරිදි වේ.

සුරක්ෂිතතා සහ සෞඛ්‍ය කමිටුවක්

- සභාපති
- ලේකම්
- සේවායෝජකයාගේ නියෝජිතයින් හා
- සේවකයින්ගේ නියෝජිතයින්

යන අයගෙන් සැදුම් ලද්දක් විය යුතුය

සුරක්ෂිතතා කමිටුවේ සභාපති සේවායෝජකයා හෝ ඔහු විසින් බලය පවරන ලද කළමනාකරුවෙකු විය යුතුය.

ආයතනයේ සුරක්ෂිතතා නිලධාරියා කමිටුවේ ලේකම් ලෙස කටයුතු කල යුතු අතර සුරක්ෂිතතා නිලධාරියෙකු නොමැති අවස්ථා වලදී සභාපති විසින් නම් කල අයෙකු හෝ කමිටු සාමාජිකයින් අතරින් පත්කර ගත් අයෙකු ලේකම් ලෙස කටයුතු කල යුතුය.

## කමිටු සාමාජික සංඛ්‍යාව

කමිටු සාමාජික සංඛ්‍යාව සේවා ස්ථානයේ සේවක සංඛ්‍යාවට සරිලන පරිදි විය යුතු අතර සේවක හා කළමනාකාරිත්වය යන දෙපාර්ශවයම නියෝජනය විය යුතුය. පහත පරිදි පත් කිරීම සුදුසුය.

| ආයතනයේ සේවක සංඛ්‍යාව | සේවක සාමාජික සංඛ්‍යාව | කළමනාකාරිත්වයේ සාමාජික සංඛ්‍යාව |
|---|---|---|
| 100 ට අඩු | 4 | 1 |
| 101 - 500ත් අතර | 7 | 2 |
| 500 ට වැඩි | 12 | 3 |

- කමිටු සාමාජිකයින් පත්කිරීමේදී ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වීමට අවස්ථාව ලබාදිය යුතුය. එසේ ඉදිරිපත් වන සංඛ්‍යාව නියමිත සාමාජික සංඛ්‍යාවට වඩා වැඩි නම් අවශ්‍ය සංඛ්‍යාව සේවා යෝජකයා විසින් තෝරා ගත යුතුය.
- ප්‍රමාණවත් තරම් කමිටු සාමාජිකයින් සංඛ්‍යාවක් ස්ව කැමැත්තෙන් ඉදිරිපත් නොවන අවස්ථාවකදී සේවා යෝජකයා විසින් අවශ්‍ය සාමාජික සංඛ්‍යාව නම් කල හැකිය.
- කමිටු සාමාජිකයින් පත්කිරීමේදී ආයතනයේ සෑම අංශයක්ම නියෝජනය වන පරිදි පත් කිරීම සිදුකල යුතුය.

## සුරක්ෂිතතා සහ සෞඛ්‍ය කමිටුවේ කාර්යභාරය

- සුරක්ෂිත වැඩ ක්‍රමයන් (Safe Working Procedures) සැකසීම සඳහා සේවායෝජකයාට සහය වීම හා පවතින සුරක්ෂිත වැඩ ක්‍රමයන් වැඩි දියුණු කිරීම සඳහා යෝජනාවන් ඉදිරිපත් කිරීම.
- සේවා ස්ථානයේ සිදුවන ආසන්න අනතුරු (Near Misses), අනතුරු, අන්තරාදායි සිදුවීම් හා වෘත්තිය රෝග පිලිබඳව අධ්‍යයනය කර ඒවා නැවත සිදුවීම වැලැක්වීම සඳහා යෝජනාවන් ඉදිරිපත් කිරීම.
- සේවා ස්ථානය පෙර නියම කරගත් කාල පරාසයන් තුල පරික්ෂා කර උපද්‍රවයන් හඳුනා ගැනීම, අවදානම තක්සේරු කිරීම, අවදානම ඉවත් කිරීමට හෝ සම්පූර්ණයෙන් ඉවත් කිරීමට නොහැකි අවස්ථා වලදී අවම කරගැනීමට සුදුසු යෝජනාවන් ඉදිරිපත් කිරීම.
- නිෂ්පාදන ක්‍රියාවලියේ, යොදාගන්නා අමුද්‍රව්‍ය වල, ගොඩනැගිල්ලේ හෝ යන්ත්‍ර සැකැස්මෙ (Machine Layout) වෙනස් වීමකදී එම වෙනස් වීම නිසා ඇතිවිය හැකි අවදානම් පිලිබඳව සේවා යෝජකයා දැනුවත් කිරීම හා ඒවා ඉවත් කිරීමට හෝ සම්පූර්ණයෙන් ඉවත් කිරීමට නොහැකි අවස්ථා වලදී අවම කරගැනීමට සුදුසු යෝජනාවන් ඉදිරිපත් කිරීම.
- ආයතනයේ සුරක්ෂිතතා සංස්කෘතියක් ඇතිකර ගැනීමට හා සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය කිරීමට යෝජනා ගෙන ඒම.
- පුද්ගල ආරක්ෂක උපකරණ භාවිතය ප්‍රවර්ධනය කිරීම.
- හදිසි අවස්ථාවකදී ගතයුතු ක්‍රියාමාර්ග තීරණය කිරීමේදී සැලකිය යුතු කරුණු යෝජනා කිරීම.

## සුරක්ෂිතතා සහ සෞඛ්‍ය කමිටුව රැස්වීම

- පෙර නියම කරගත් කාල පරාසයන් තුල සුරක්ෂිතතා කමිටුව රැස්විය යුතු අතර මෙම කාල පරාසය මාස තුනකට වැඩි නොවීම සුදුසුය.
- ඉහත රැස්වීම් වලට අමතරව සේවා ස්ථානයේ සිදුවන අනතුරකට, අන්තරාදායි සිදුවීමකට හෝ වෘත්තීය රෝගයක් වාර්තා වීමකට පසුව නොපමාව ඒ පිළිබඳව සාකච්ඡා කල යුතුය.
- සේවායෝජකයා විසින් කමිටුව රැස්වීම සඳහා පහසුකම් සැලසිය යුතු අතර කමිටුවේ සෑම සාමාජිකයෙකුටම සේවා කාලය තුලදී රැස්වීමට සහභාගී වීමට ඉඩකඩ සැලසිය යුතුය.

- සේවා ස්ථානයේ සිදුවූ අනතුරක්, අන්තරාදායි සිදුවීමක් හෝ වෘත්තීය රෝගයක් සම්බන්ධව සාකච්ඡා කරන අවස්ථාවකදී කමිටු සාමාජිකයෙකු නොවන සේවකයෙකුට එම සිදුවීම පිළිබඳව දැණුමක් තිබේ නම් ඔහුවද සාකච්ඡාවට සහභාගී කරවා ගත හැකිය.
- කමිටු රැස්වීමකදී වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යයට අදාල කරුනු පමණක් සාකච්ඡා කල යුතුය.
- සුරක්ෂිතතා කමිටු රැස්වීමේ සාකච්ඡා සටහන් පිටපත් කමිටුවේ සියළු සාමාජිකයින්ට සහ සේවා යෝජකයාට රැස්වීමේ දිනයේ සිට සති දෙකක් ඇතුලත ලබා දිය යුතු අතර සේවා යෝජකයා තම පිටපත් අවම වශයෙන් වසර දෙකක් සුරක්ෂිතව තබා ගත යුතුය.




**සහය සඳහා අමතන්න........**

කම්කරු කොමසාරිස් (කර්මාන්තමය සුරක්ෂිතතා)
හා ප්‍රධාන කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු,
කර්මාන්තමය සුරක්ෂිතතා අංශය,
කම්කරු දෙපාර්තමේන්තුව,
97, ජාවත්ත පාර,
කොළඹ 05.
දුරකථන/ෆැක්ස්- 0112508783

දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු

| | |
|---|---|
| කොළඹ | 0112508775 |
| ගම්පහ | 0332232403 |
| මහනුවර | 0812225087 |
| කුරුණෑගල | 0372220760 |
| ගාල්ල | 0912225778 |
| අනුරාධපුර | 0252226798 |
| රත්නපුර | 0452232069 |
| කළුතර | 0342229183 |
| යාපනය | 0212224052 |
| බදුල්ල | 0552223554 |

## සුරක්ෂිතතාවය ඔබෙන් ඇරඹේ!

# කම්කරු දෙපාර්තමේන්තුව

## කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

## වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යය ප්‍රවර්ධනය සඳහා සුරක්ෂිතතා සහ සෞඛ්‍ය කමිටු!

